## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2016

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1**

ප්‍රමිතයේ 99 ඡේදය ප්‍රකාරව ආයතනයක් විසින් එහි වියදම්, වියදම්වල ස්වභාවය අනුව හෝ ආයතනයේ කාර්යයන්ට අදාලවන ආකාරයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වුවත් නියාමන වියදම්වලට පරිබාහිර කාර්යයන් සඳහා වැය කර තිබුණු රු. 101,575,000 ක් සභාවේ කටයුතු නියාමනය කිරීමේ වියදම් (Regulatory Expenses) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) කොමිෂන් සභාවට අයත් ලෙස පසුගිය වසර 13 දක්වා අවසන් ගිණුම්වල සටහනක් මගින් දක්වා තිබූ කටාන ප්‍රදේශයේ පිහිටි අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ක ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්පත් කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් හෝ කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 473,547,519 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ, ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර අවුරුදු 10 කට හා අවුරුදු 05 කට වරක් අළුත් කිරීමේදී අයකරන ගාස්තු අළුත් කිරීම සිදුකළ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවත් මේ සඳහා අදාල කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ රු. 107,708,483 ක් වූ මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.1,751,344,170 ක් දක්වා විචලනය වී තිබුණි.

**(ඈ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23**

**------------------------------------------**

නෙළුම් කුළුණ ඉදිකිරීමේ කටයුතු සඳහා එ.ජ. ඩොලර් මිලියන 88.66 ක ණය මුදලක් 2012 වර්ෂයේදී ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එයින් එ.ජ. ඩොලර් මිලියන 43.75 ක් වැය කර තිබුණි. මෙම ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. මිලියන 1,987 ක ණය ගැනුම් පිරිවැයක් දරා තිබුණද ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධනිත කරන ලද සුදුසුකම් ලත් ණය ගැනුම් පිරිවැයෙහි ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**(ඉ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

**------------------------------------------**

පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වුවද පිරිවැය රු.8,429,774 ක් වටිනා පරිගණක මෘදුකාංග දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර වත්කම් ලෙස පරිගණක ජාලගත කිරීම සඳහා වැය කරන ලද රු. 761,531 ක් හා ජල පොම්ප මිලදී ගැනීම වෙනුවෙන් වැය කරන ලද රු. 146,750 ක් අළුත්වැඩියා හා නඩත්තු වියදම් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුකළ අගය මත බදු මුදල උපලේඛනය අනුව රු. 60,447,939 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු බදු මුදල ලෙස රු. 32,931,752 ක් දක්වා තිබීම හේතුවෙන් එම ශේෂය රු. 27,516,187 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පාරිතෝෂිත මුදල් ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයේ ලද රු. 3,097,404 ක පොලී මුදල, පාරිතෝෂිත ස්ථාවර තැන්පතුවලට එකතු කර පෙන්විය යුතු වුවත් එසේ නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජනවලට එකතුකර දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා උපදේශනාත්මක සේවාවන් ලබාගැනීමේ වියදම් ඇතුළුව එකතුව රු. 7,568,582 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) මූල්‍ය ගිණුම්කරණ සටහන් 3.4 ට අනුව උපචිත පදනම මත හඳුනා නොගත් සෙස්, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC), පිටතට යැවෙන ඇමතුම් ගාස්තු බදු (Levy on OLAC) හා විදුලි සංදේශ බදු (Telecommunicution Levy) සඳහා රු.3,572,005,795 ක් ලැබිය යුතු අයිතම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.3** **පැහැදිලි නොකළ වෙනස්කම්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු සෙස් ගාස්තු ශේෂය රු. 397,538,451 ක් ලෙස දක්වා තිබුණද උපලේඛණය අනුව එය රු. 395,260,175 ක් වූයෙන් රු. 2,278,276 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) වැටුප් පාලන ගිණුමේ ශේෂය ශුන්‍ය විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට රු. 134,543 ක ශේෂයක් පැවතිණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සංඛ්‍යාත ආදායම රු. 7,496,092,897 ක් වුවද මාසික බදුගෙවීම් උපලේඛන අනුව එය රු. 7,028,943,336 ක් වූයෙන් රු.467,149,561 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ කුලී පදනම මත භාවිතා කිරීම සඳහා ආයතන 09 ක් වෙත සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලබාදී තිබූ අතර එයින් ආයතන 05 ක් සම්බන්ධයෙන් ගිවිසුම්ගතව නොතිබුණි. මේ අනුව එම ආයතනවලින් අයවිය යුතු කුලී ගාස්තු හා විදුලි ගාස්තු අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් නොතිබුණු අතර මේ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වර්ෂ 03 සිට වර්ෂ 06 දක්වා කාලයක් ගත වී තිබුණි. 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විදුලි ගාස්තු ලෙස කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණු රු. 91,665,480 ක් මෙම ආයතනවලින් අයවිය යුතුව පැවතුණි.

(ආ) සන්නිවේදන ක්‍රියාකරුවන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත අනුව ක්‍රියාකරුවන් 05 දෙනෙකුගෙන් නියමිත පරිදි බදු සහ අධිභාර අයකර ගෙන නොතිබුණි.

(ඈ) සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් කොමිෂන් සභාවේ ණයගැතියන් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 3,212,959,639 ක ශේෂයෙන් රු. 341,614,949 ක් වර්ෂ 02 කට වැඩි ණයගැතියන් විය. මෙම ණය ශේෂය තුල වර්ෂ 20 කට වැඩි කාලයක සිට ශේෂව පැවති ණය ශේෂයන්ද ඇතුළත් වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ලබාදුන් සංඛ්‍යාත සඳහා 1981 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අයවිය යුතුව පැවති රු. 154,438,373 ක ගාස්තු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) ඉලෙක්ට්‍රොටෙක් ලිමිටඩ් වෙතින් 2008 මාර්තු 01 දින සිට 2009 පෙබරවාරි 28 දින දක්වා වාර්ෂික බලපත්‍ර ගාස්තුව වශයෙන් රු.172,500,000 ක් අයවිය යුතුව පැවතුණි.

(උ) තහවුරු ලිපි යැවීම සඳහා ණයගැතියන් තෝරාගැනීම පදනමකින් තොරව සිදුකර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 3,212,959,639 ක් වටිනාකමැති ණයගැතියන් 2,619 දෙනෙකු සිටියද තහවුරු ලිපි යවා තිබුණේ ණයගැතියන් 90 දෙනෙකු සඳහා පමණි. එයින් 69 ක් ශුන්‍ය ශේෂ සඳහා වූ අතර ඉතිරි ණයගැතියන් 21 හි අගය රු. 863,061,566 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් රු. 5,400,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව කොමිෂන් සභාවේ අරමුදලින් රු.7,231,842 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 261(3) | දිනපතාම මුදල් පොතේ ගණන් හිලව් එකතු කොට ශේෂය දැන ගත යුතුය. ප්‍රමාණවත් තරම් මුදල් ඇතොත් මිස කිසියම් ගෙවීමක් මුදල් පොතෙහි සටහන් කිරීම හෝ ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කිරීම හෝ නොකල යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහජන බැංකු ගිණුමට අදාල මුදල් ශේෂය රු. 115,434,747 ක සෘණ අගයක් තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය | භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභා අනුමැතිය මත කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් බඳවා ගැනීම් සඳහා බඳවා ගැනීම් පරිපාටියක් සකස් කර භාවිතා කර තිබුණි. |
| (ඉ) | 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.3 වගන්තිය | නිලධාරියෙකු සිය නිත්‍ය ආයතනයට අමතරව වෙනත් ආයතනයක සේවයේ නියැලෙන අවස්ථාවක දෙවන තනතුර සඳහා හිමි දීමනාවෙන් සියයට 50 ක් ගෙවිය යුතු වුවද, කොමිෂන් සභාවේ සභාපතිවරයාට දෙවන තනතුර සඳහා හිමි දීමනා ලෙස කොමිෂන් සභා තීරණයක් අනුව 2015 වර්ෂයේ ජූලි මාසයේ සිට රු. 100,000 බැගින් වූ සම්පූර්ණ දීමනාවම ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 1990 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ ලිපිය | රාජ්‍ය සංස්ථා, රජයේ ආයතන, වෙළඳ ව්‍යාපාර සහ මහජන සමාගම්වල සියළු නෛතික වැඩ කටයුතු සම්බන්ධයෙන් සේවාවන් නීතිපතිවරයා විසින් ඉටුකළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණද, කොමිෂන් සභාව නීතිමය සේවාවන් ලබාගැනීම වෙනුවෙන් පුද්ගලයන් වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,349,408 ක් ගෙවා තිබුණි. |
| (උ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයේ අයිතමයන් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි විස්තර ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම දේපළ පිරියත හා උපකරණ යටතේ ඉඩම්වල වටිනාකම රු.148,863,771 ක් ලෙස දක්වා තිබුණද එම ඉඩම් මොනවාද යන්න හා ඉඩම්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබුණි. |
| (ඌ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 2.8.4 වගන්තිය | තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා අවම වශයෙන් එක් සාමාජිකයෙකු රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් දැනුමක් ඇති අයකු සිටිය යුතු වුවත් අවස්ථා 06 කදී එකතුව රු.15,674,324 ක මිලදී ගැනීම් සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් තිදෙනාම කොමිෂන් සභාවේ නිලධාරීන් විය. |
| | (ii) 4.2.1 වගන්තිය | වසර 3ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කිරීම සහ ඊළග එළඹෙන වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවද කොමිෂන් සභාව එම ආකෘතියට අනුකූලව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 හි විධිවිධාන අනුගමනය නොකර කොමිෂන් සභා තීරණ මත හා අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුගත වෙමින් කාර්යමණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා ගෙවල් කුලී දීමනා ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා මෙසේ ගෙවා ඇති මුදල රු. 53,329,079 ක් විය.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2007 ජුනි 01 දිනැති හා අංක එන්එස් සීසී/3/ඒබීසී/24 දරන ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩලය සඳහා රු.2000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද, කොමිෂන් සභාව විසින් මාසිකව රු. 6,000 බැගින් වූ ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ගෙවා ඇති මුළු මුදල රු.18,756,408 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 54,613,961,089 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 47,215,344,134 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,398,616,955 ක වර්ධනයක් දක්නට ලැබුණි. බලපත්‍ර ගාස්තු ආදායම, විදුලි සංදේශ බදු ආදායම සහ විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම රු. 9,516,861,172 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එකතු කළ අගයෙහි වැඩිවීම රු. 7,754,827,633 ක් පෙන්නුම් කළද සමාලෝචිත වර්ෂයේදී එකතු කර තිබුණු රු. 367,346,939 ක සංඛ්‍යාත පූර්ව ගාස්තුවල (Frequency upfront) බලපෑම හා රු. 21,167,983 ක කොකාවිල් කල්බදු වාරිකවල බලපෑම ඉවත් කළ පසු සමාලෝචිත වර්ෂයේ එකතු කළ අගයෙහි වැඩිවීම රු. 7,366,312,711 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවේ ආදායම හා වියදම ඉකුත් වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී අනුපාතයේ සාමාන්‍යය සියයට 6.5 ක් වූ අතර 2016 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී අනුපාතයේ සාමාන්‍යය සියයට 10 ක් වූයෙන් පසුගිය වසරට සාපේක්ෂව ස්ථාවර තැන්පතු මත පොලී ආදායම සියයට 438 කින් වැඩි වී තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයක් වෙතින් සංඛ්‍යාත පූර්ව ගාස්තු රු. 367,364,939 ක් අයකර ගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ සංඛ්‍යාත පූර්ව ගාස්තු සියයට 100 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) පසුගිය වසරට සාපේක්ෂව ආර්ථික සමාජ වගකීම් වියදම් රු. 88,661,075 කින් වැඩිවීම හේතුවෙන් නියාමන වියදම් සියයට 68 කින් වැඩිවී තිබුණි.

(ඈ) කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරන ක්‍රියාකරුවන් තිදෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට අයවිය යුතු රු.13,274,668 ක්වූ කල්බදු වාරික මුදල් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ ගිණුම් ගතකිරීම නිසා එම අගය සියයට 100 කින් ඉහළ ගොස් තිබුණි.

## 3.3 කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන 02 ක් විසින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත කොමිෂන් සභාවෙන් එකතුව රු. 47,346,612,000 ක් වන්දි ලෙස ඉල්ලා නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ණාවලී අංශය විසින් සිදුකිරීමට සැලසුම් කර තිබූ අත්‍යාවශ්‍ය වැඩසටහන් 03 ක් හා නීති අංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සමාජීය අවශ්‍යතාවයක් ලෙස හඳුනාගත හැකි අන්තර්ජාල ළමා ආරක්ෂණ (Net Safe Child Protection) වැඩසටහන සඳහා රු. මිලියන 702.5 වෙන්කර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අධිවේග අන්තර්ජාල ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා දුරකථන ක්‍රියාකාර සමාගම්වලට පහසුකම් සැපයීමේ ප්‍රගතිය සියයට 70 ක් විය. මෙහිදී ඩයලොග් සමාගම සඳහා පමණක් එය ක්‍රියාත්මක කළ බවත් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ SE-ME-WE-S භූගත මධ්‍යස්ථානය ඉදිකිරීම 2016 වර්ෂය තුළදී සම්පූර්ණ කර නොතිබුණ බවත් වාර්තා කර තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහය ලබාගෙන සිදුකළ යුතු විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා 2016 වර්ෂයේදී යෝජනා ලබාගැනීම පමණක් සිදුකර තිබුණි. නිලධාරීන් මාරු කිරීම හේතුවෙන් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීම 2017 වර්ෂයට කල් දමා ඇති බව වාර්තා කර තිබුණි.

(ඈ) බලපත්‍ර අංශය විසින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද සවිබල ගැන්වීමේ (E-Nable) තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය සියයට 50 ක් පමණක් විය. නිලධාරීන් මාරු කිරීම හේතුවෙන් ඉතිරි කටයුතු 2017 වර්ෂයට කල් දැමූ බව කොමිෂන් සභාව විසින් දන්වා තිබුණි.

(ඉ) බලපත්‍ර අංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රවීනයන්ගේ සහයෝගිතා වැඩසටහන (ITU Expert Assistance Programme) 2015/2016 විදුලි සංදේශ පනතේ සංශෝධනයක් සිදුකිරීමට අවශ්‍යවීම හේතුවෙන් කල්දැමූ බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

(ඊ) විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සහ හවුලේ පරිහරණය කිරීමේ මාර්ගෝපදේශ සමාලෝචනය මාසයකට වරක් පැවැත්විය යුතු වුවත් 2016 වර්ෂය තුළදී රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පත් ආපසු ලබාගැනීමේදී රු. 7,000,000,000 ක් වටිනාකමැති ස්ථාවර තැන්පත් 04 ක් කල්පිරීමට පෙර මහා භාණ්ඩාගාරයට මුදල් යැවීම සඳහා ලබාගෙන තිබුණු අතර එසේ කල්පිරීමට පෙර ලබා ගැනීම නිසා රු. 213,805,480 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22(උ) වගන්තිය යටතේ වූ නියමය පරිදි සහ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගෙන් ආයතන 03 ක් සෙස් ගාස්තු ගෙවා නොතිබුණි. මෙයින් එක් ආයතනයක් 2012 වර්ෂය සඳහාද තවත් ආයතනයක් 2015 හා 2016

වර්ෂ සඳහාද අනෙක් ආයතනය 2016 වර්ෂය සඳහාද සෙස් ගාස්තු ගෙවා නොතිබුණි. සෙස් බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකිරීමේ අවශ්‍යතාවය වරින් වර පෙන්වා දුන්නද එවැනි ක්‍රමවේදයක් සකස් කිරීම මේ දක්වා සිදුකර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුවන් විදුලි හා රූපවාහිනී සංඛ්‍යාත බලපත්‍ර භාවිතය පිරික්සුම් (Monitoring) කිරීම

(i) සංඛ්‍යාත බලපත්‍ර භාවිතය පරීක්ෂා කළ යුතු ආයතන තීරණය කිරීම, එම ආයතන පරීක්ෂා කිරීම, පරීක්ෂා කළ ආයතන සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම, පොලිසියට පැමිණිලි කිරීම, පැමිණිල්ල සඳහා සාක්ෂිකරු වශයෙන් කටයුතු කිරීම යන කරුණු එකම නිලධාරියෙකු විසින් සිදු කිරීම නිසා සංඛ්‍යාත බලපත්‍ර පරීක්ෂා කිරීමේ කටයුතු විධිමත් අයුරින් සිදුව නොතිබුණි.

(ii) නිරීක්ෂණ කටයුතු සඳහා වර්ණාවලි අංශය වෙත ලබා දී තිබූ වාහන 03 ක් භාවිතා කළ නොහැකි මට්ටමේ පැවතිණි. මෙම වාහන අවුරුදු 16 කට පමණ පෙර මිලදී ගෙන ඇති බැවින් නිරීක්ෂණ කටයුතු කාර්යක්ෂමව නියාමනය කිරීමට බාධා ඇති වී තිබුණි.

(iii) සංඛ්‍යාත උපකරණ සහිත පාවිච්චි කළ හැකි වාහනය 2015 ජනවාරි 01 දින සිට 2016 අගෝස්තු 01 දින දක්වා සංඛ්‍යාත භාවිතා කිරීම් පරීක්ෂා කර තිබුණේ ආයතන 17 ක් සඳහා ගමන් වාර 08 ක් පමණි. ඒ අනුව සංඛ්‍යාත භාවිතා කිරීම ප්‍රමාණවත් පරිදි සිදුනොකිරීම හේතුවෙන් මෙම වාහනය ඌන උපයෝජිතව පැවතුණි.

(iv) ගුවන් විදුලි රූපවාහිනී සංඛ්‍යාත උපකරණ වෙනත් පාර්ශවයන්ට පැවරීම හෝ ඔවුන්ගේ අනුදැනුම යටතේ භාවිතයට ගැනීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අවසරයකින් තොරව ඉඩ නොතැබිය යුතු බව බලපත්‍ර කොන්දේසියක් පනවා ඇත. එහෙත් එසේ විකාශන උපකරණ ලබාදුන් ආයතන 05 ක උපකරණ වෙනත් ආයතන මගින් අත්පත් කරගෙන ක්‍රියාකරවන බව කොමිෂන් සභාව විසින් අනාවරණය කර ගෙන තිබුණි. එසේ වුවද මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) ගුවන් විදුලි හා රූපවාහිනී සංඛ්‍යාත ලබා දී තිබූ විකාශන සමාගමේ/ ආයතනයේ නාලිකා නාම හා ව්‍යාපාර නාම වෙනස් වීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම්, ලිපින වෙනස්වීම්, ව්‍යාපාර ලියාපදිංචි අංක වෙනස්වීම් සිදුවී ඇති අවස්ථා අනාවරණය විය. මෙම වෙනස්වීම් සම්බන්ධ තොරතුරු කොමිෂන් සභාව විසින් ලබාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණ අතර අදාල ආයතන විසින්ද මෙවැනි වෙනස් වීම් සම්බන්ධයෙන් තොරතුරු නිසි පරිදි ඉදිරිපත් කිරීමක් සිදු නොකරන බව නිරීක්ෂණය විය. මෙහිදී කොමිෂන් සභාව සංඛ්‍යාත ලබාදුන් සමාගම්වල අයිතිය වෙනස් වී තිබේද යන්න තහවුරු කර නොගෙන බලපත්‍ර ලබා දී තිබුණි.

(ආ) විකුණුම්කරුවන්ගේ බලපත්‍ර ආදායම් අයකර ගැනීම

(i) ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, පැවරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම කිසිවකු විසින් සිදු කෙරේ නම් ඒ සඳහා 1996 අංක 27 දරන විදුලි සංදේශන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබාගත යුතුය. අංක 1182/12 හා 2011 මැයි 03 දින දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව යථෝක්ත බලපත්‍රය ලබා ගැනීමේ දී එහි සඳහන් ගාස්තු ගෙවිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කර තිබුණි.

එසේ වුවද බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව විවිධ ආයතන ව්‍යාපාරික කටයුතු වල නිරත වන බව අනාවරණය විය. එවැනි ව්‍යාපාරික කටයුතු වල නිරත වන ආයතන 90 ක නියදියකින් ආයතන 79 ක් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ii) 2014 ජනවාරි 01 දින සිට 2016 ඔක්තෝබර් 25 දින දක්වා කාල පරිච්ඡේදය තුල නිකුත් කරන ලද විකුණුම් කරුවන්ගේ බලපත්‍ර පිළිබඳ විස්තරවලට අනුව ආයතන 1,103 ක් සඳහන් වුවද එයින් ආයතන 274 ක බලපත්‍ර 2016 ඔක්තෝබර් 25 දින වන විටත් කල් ඉකුත් වී තිබුණි. බලපත්‍රලාභීන්ට නිසි වේලාවට බලපත්‍ර අළුත්කර ගැනීමට අදාල ලිපි යවා ඇති බව දන්වා තිබුණද බලපත්‍ර අළුත් කර නොගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ව්‍යාජ දුරකථන, වෙළඳපොලට සැපයීම වැලැක්වීමේ අරමුණ ඇතිව විදුලි සංදේශ නියාමන කොමිෂම මගින් පාලන උපකරණ අනන්‍යතා ලේඛනය (Control Equipment Identity Register) ස්ථාපිත කිරීමට 2013 වර්ෂයේදී තීරණය කර තිබුණද එය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ආදායම් බදු වගකීම රු. 321,765,766 ක් වුවද වර්ෂය තුලදී කාර්තුමය ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි. තෙවන සහ සිව්වන කාර්තු සඳහා රු.මිලියන 125 බැගින් 2017 අප්‍රේල් 07 වන දින ප්‍රමාද වී ගෙවීම් සිදුකර තිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල නිලධාරීන් හා ඔවුන්ගේ පවුල් සඳහා සිදුකළ සුහද හමුව හා චාරිකාව වෙනුවෙන් පෞද්ගලික හෝටලයක නවාතැන් ගැනීම, ආහාර පාන හා වෙනත් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 4,700,370 ක් කොමිෂන් සභා අරමුදලින් වැයකර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2(අ) වගන්තියට අනුව අවම වශයෙන් ප්‍රසිද්ධ එක් පුවත්පතක දැන්වීම් පලකිරීම ප්‍රමාණවත් වුවද කොමිෂන් සභාව විසින් කාර්යමණ්ඩල පුරප්පාඩු 70 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාලව 2015 වර්ෂයේ ජූනි මාසයේදී රු. 4,213,694 ක් වැයකර පුවත්පත් 06 ක දැන්වීම් පලකර තිබුණි. කෙසේ වුවද මෙම තනතුරු සඳහා බඳවා ගැනීමද සිදුකර නොතිබුණි.

## 4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කොමිෂන් සභාවේ අරමුණුගත කාර්යයක් නොවන චිත්‍රපටයක් හා ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 32,191,906 ක් හා රු. 7,160,400 ක මුදලක් කොමිෂන් සභා අනුමැතිය මත 2015 වර්ෂයේදී වැයකර තිබුණි.

## 4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

නෙළුම් කුළුණ ව්‍යාපෘතියට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මැයි 12 දින වන විට දින 912 කින් නිම කිරීමට නියමිත වූ මෙම ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් 31 දක්වා නැවතත් දින 903 කින් දීර්ඝ කිරීමට කොමිෂන් සභා තීරණයක් ගෙන තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණද ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම හෝ ගිවිසුම් ප්‍රකාර ප්‍රමාද ගාස්තු අයකිරීම සිදුකර නොතිබුණි.

(ආ) උපදේශන සේවා සැපයීම සඳහා වූ 2013 පෙබරවාරි 15 දිනැති මොරටුව විශ්ව විද්‍යාලය සමඟ වූ ගිවිසුම අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 ක්වූ රු.198,691,500 ක ස්ථාවර ගාස්තුවක් කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී තිබුණි. කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දීර්ඝවීම මත ඊට අමතරව මාසයකට රු. මිලියන 3 බැගින් උපරිමය රු. මිලියන 72 ක් දක්වා මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවීමට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එකඟවී 2017 ජූලි දක්වා රු. මිලියන 66 ක් ගෙවා තිබුණි.

(ඇ) නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් සේ සලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුළුණ ඉදිකිරීමට තෝරාගත් ඉඩම සඳහා දැනට වැයකර ඇති පිරිවැය පමණක් අයකර ගැනීමේ පදනම මත එම ඉඩම එකී අධිකාරිය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා දිය යුතු බවට 2011 දෙසැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය මඟින් තීරණය කර තිබුණද මෙතෙක් එම ඉඩම පවරා ගෙන නොතිබුණි. එසේ වුවද අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව කොමිෂන් සභාව විසින් එම අධිකාරියට ඉඩමේ වටිනාකම වශයෙන් රු. මිලියන 11,612 ක් වසර 34 කින් ගෙවීමට එකඟ වී තිබුණ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට මේ වෙනුවෙන් රු. මිලියන 2,250 ක් ගෙවා තිබුණි.

(ඈ) 2016 ජූනි 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද අංක 9 නියෝගය අනුව ආයතනය ණයක් ලබා නොගෙන ආයතනයේ මුදල් වලින් මෙම ඉදිකිරීම සිදු කලේ නම් ලැබෙන ප්‍රතිලාභය යනාදී කරුණු ඇතුලත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත එවීමට නියෝග කළද එය ඉදිරිපත් කර නොතිබුණි. 2016 ජූනි 23 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නෙළුම් කුළුණ ඉදි කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු බව අවධාරණය කළ ද මෙතෙක් එය සිදුකර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතිය සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැලසුම් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වුවත් එම යටිතල පහසුකම සකස් කිරීමට පළමු අදියරේදී සැලසුම් කර නොතිබුණි. වාහන නවතා තැබීමේ පහසුකම පළමු අදියරේදීම ක්‍රියාත්මක නොකිරීම තුලින් ඉපයිය හැකි ආදායම අහිමි වී යාමක් සිදු වනු ඇතැයි නිරීක්ෂණය කෙරේ

.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 292 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 207 ක් විය. මෙහිදී පුරප්පාඩු සංඛ්‍යාව 89 ක් හා අතිරික්ත සංඛ්‍යාව 04 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයේ සහ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධන සිදුකිරීමේ කටයුතු මෙතෙක් නිමකර නොතිබුණ අතර අත්‍යවශ්‍ය සේවා සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

(ආ) සහකාර ගණකාධිකාරි තනතුර අනුමත තනතුරක් නොවුවද කොමිෂන් සභා තීරණය මත ස්ථිර පදනම මත සහකාර ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු 2015 ජනවාරි 01 දින බඳවා ගෙන තිබුණි. ඊට අමතරව කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකුගේ අතිරික්තයක් විය.

(ඇ) අතිරේක/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 03 ක් ඇතුළුව නිත්‍ය කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබූ අතර ද්විතියික පදනම මත නිලධාරීන් 12 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 07 දෙනෙකු 2016 දෙසැම්බර් 31 වන විට සේවයේ යොදවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තියට අනුව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 10 දින දීය. කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඒ සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2014 හා 2015 වර්ෂවල වාර්ෂික වාර්තා 2017 සැප්තැම්බර් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීමට සැලසුම් කර තිබූ රු.7,375,000 ක් වටිනා භාණ්ඩ අයිතම් 13 ක් මිලදීගෙන නොතිබුණි. භාණ්ඩයේ මිල හා සැබෑ අවශ්‍යතාවය නැවත සලකා බලා අත්‍යවශ්‍ය භාණ්ඩ පමණක් මිලදී ගෙන ඇති බව කොමිෂමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දන්වා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ මූල්‍ය අංශය පරිගණක ගත කිරීම සඳහා රු.10,000,000 ක් හා ප්‍රධාන කාර්යාලයේ නවීකරණ කටයුතු සඳහා රු. 954,000,000 ක් වෙන් කර තිබුණද එම කාර්යයන් සිදු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් නොවූ රු.10,346,157 ක් වටිනා භාණ්ඩ අයිතම් 39 ක් මිලදී ගෙන තිබුණ අතර අවස්ථා 03 කදී වටිනාකම රු. 3,579,867 ක් වූ අයිතම 25 ක් ඇස්තමේන්තු ගත වටිනාකම ඉක්මවා මිලදී ගැනීම් සිදුකර තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් 29 දින අනුමත කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 11 සිට සියයට 221 දක්වා ධන විචලනයන් ද සියයට 7 සිට සියයට 356 දක්වා ඍණ විචලනයන් ද නිරීක්ෂණය විය. තවද අවස්ථා 11 කදී වටිනාකම රු. මිලියන 35 ක් අයවැය ලේඛන ප්‍රතිපාදන නොමැතිව වැයකර තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපති වෙත වාර්තා කළ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණය පාලනය | දීර්ඝ කාලීනව පරිශේෂ වූ ණය ශේෂ පැවතීම හා ණය අයකර ගැනීම දූර්වල තත්ත්වයක පැවතීම. |
| (ආ) | ආදායම් පාලනය | ආදායම් එකතු කර ගැනීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබීම. |
| (ඇ) | දීමනා ගෙවීම් | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ මත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා නිවාස කුලී දීමනා ගෙවීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පාලනය | නෙළුම් කුළුණ ඉදිකිරීම් කටයුතු නියමිත දිනට සිදු නොකිරීම. |